<u>**හම්බන්තොට දිස්ත්‍රික් විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීම**</u>

<u>**2025.07.11**</u>

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සමසභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සමසභාපති, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර බන්දුල හරිස්චන්ද්‍ර මැතිතුමාගේ, පළාත් සභා හා පළාත් පාලන ගරු නියෝජ්‍ය අමාත්‍ය පී. රුවන් සෙනරත් මැතිතුමා ඇතුළු දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් පාලන ආයතනවල ගරු නගරාධිපති හා ගරු සභාපතිවරුන්ගේ හා රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.07.11 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ අතිගරු ජනාධිපතිතුමා ඇතුළු සියලුම දේශපාලන නායකත්වය සහ සියලුම රාජ්‍ය නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් තුමා විසින් පිළිගන්නා ලදී. දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු පැහැදිලි කරමින්, දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන්ගෙන් මෙන්ම විවිධ ආයතනවල නිලධාරීන්ගෙන් සහ ආණ්ඩුකාරතුමා ප්‍රමුඛ දකුණු පළාත් සභාවෙන් ද මනා සහයෝගයක් ලැබෙන බවත්, නිරන්තර සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කරන බවත් සඳහන් කරමින්, දිස්ත්‍රික්කයේ දැනට මුහුණ දෙන අභියෝග/ ගැටලු අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.

ඒ යටතේ, දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී පැන නැඟී ඇති ගැටලු අතරින් පහත සඳහන් ගැටලු පිළිබඳ විශේෂ අවධානය යොමු කරන ලදී.

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ කෘෂි නිෂ්පාදන අලෙවි කර ගැනීමේ ගැටලුව.
- මානව හා භෞතික සම්පත්වල හිඟතාවය.
- දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීමට අනුමත වන මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘති හා සංචාරක ව්‍යාපෘති පිළිබඳව ආයතනික සම්බන්ධීකරණය සඳහා විශේෂ දිස්ත්‍රික් ඒකකයක් පිහිටුවීමේ අවශ්‍යතාවය.

දිස්ත්‍රික්කයේ ඉදිරි අභියෝග වශයෙන්

- 1. කිරි කර්මාන්තය මුහුණ දෙන අභියෝග
  2. ලුණු කර්මාන්තය තවදුරටත් පවත්වාගෙන යාම
- හම්බන්තොට නගර සංවර්ධන සැලැස්ම.
- ප්‍රජා ශක්ති වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පවතින නිලධාරී හිඟය.

පෙන්වාදුන් අතර, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් දිස්ත්‍රික්කය තුළින් ඉස්මතුකිරීම සඳහා සමස්ථ සූදානම ලෙස

- අල්ලස හා දූෂණය තුරන් කිරීමට මහජනයා පෙළඹවීම.
- VDP ව්‍යාපෘති 576ක් සම්පූර්ණ කිරීම.
- ප්‍රජාශක්ති වැඩසටහනට ප්‍රමුඛතාවය ලබාදීම බව වැඩිදුරටත් කරුණු දක්වන ලදී.

අනතුරුව, පොහොසත් රටක් ලස්සන ජීවිතයක් සමස්ථ ජනතාවට උරුමකර දීමේ පරම චේතනාවෙන් කටයුතු කරන අතිගරු ජනිධිපතිතුමා වෙත විශේෂ සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ ඉදිරි කටයුතු සිදුකරගෙනයාම සඳහා ආරාධනා කරන ලදී.

ඒ අනුව, රට ආර්ථික වශයෙන් ඉදිරියට ගෙන යමින් ජනතාවට උසස් ජීවන තත්ත්වයක් උදා කර දීමේදී දේශපාලන අධිකාරිය සහ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ යාන්ත්‍රණයක කොටස්කරුවන් විය යුතු බව අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා අවධාරණය කළේය. එහිදී කිසිවෙකුටත් වෙන් වෙන්ව කටයුතු කළ නොහැකි බව ප්‍රකාශ කළ ජනාධිපතිවරයා ජනතාව වෙනුවෙන් රජය ආරම්භ කළ වැඩපිළිවෙළ සාර්ථක කර ගැනීමට සියලුදෙනාගෙන් සහාය අපේක්ෂා කරන බව හා නිරන්තරයෙන්ම, අදාල කරුණු හා නිශ්චිත ගැටලු පමණක් සාකච්ඡා කර ඒ සඳහා නිසි පිළියම් යෝජනා කර ක්‍රියාත්මක කළ යුතු බවත්, නිතර රැස්වීම් පවත්වා කාලය නාස්ති නොකළ යුතු බවටත් උපදෙස් දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් වී ඇති ගැටලු පිළිබඳව සහ න්‍යාය පත්‍රයට අනුව සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01 | අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් වූ ගැටලු | | | |
| 1.1. | දිස්ත්‍රික්කයේ පවතින ගුරු හිඟය | දිස්ත්‍රික්කය තුළ ගුරු හිඟයක් පවතින බව ඉදිරිපත් වූ අතර, එහිදී ශිෂ්‍ය සංඛ්‍යාව 50ට අඩු පාසල් පිළිබඳ ජනාධිපතිතුමා විසින් විමසීම් කරන ලදී. ඒ සම්බන්ධව නිශ්චිත තොරතුරු එම අවස්ථාවේ ඉදිරිපත් නොවූ අතර, ඉදිරිපත් කළ තොරතුරු අනුව ගුරු ශිෂ්‍ය අනුපාතය පදනම්ව දිස්ත්‍රික්කය තුළ ශිෂ්‍යයින් හා ගුරුවරුන් විසිරී ඇති ආකාරය අනුව මානව හා භෞතික සම්පත අපතේ යාමක් | දරුවන් වෙනුවෙන් ප්‍රශස්ථ අධ්‍යාපනයක් ලබාදීමට සමස්ථ දිස්ත්‍රික්කය සඳහා ගුණාත්මක සැලැස්මක් සකස් කර ඒ සඳහා ඇස්තමේන්තු, ඉදිරි අයවැයට පෙර ඉදිරිපත් කරන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දිය හැකි බවත් ජනාධිපතිතුමා විසින් දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට<br><br>ලේකම්, දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, දකුණු පළාත් |



හිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | සිදුවන බවත් සාකච්ඡා විය. තවද, දිස්ත්‍රික්කය තුළ සෑම දරුවෙකුටම ප්‍රශස්ථ අධ්‍යාපනයක් ලබා දීම සඳහා මුළු පාසල් පද්ධතියම පිළිබඳව සාමාලෝචනයක් සිදුකර ගුණාත්මක දත්ත පද්ධතියක් සකස්කර විශ්ලේෂණය කළ යුතු බවටත් සාකච්ඡා විය.<br>එසේම, හැකිම්වලින් හෝ ඉවෙන් ගැටලුවලට විසඳුම් සෙවිය නොහැකි බවත්, ඒ සඳහා විධිමත් දත්ත පද්ධතියක් අවශ්‍ය බවත් පෙන්වා දුන් ජනාධිපතිවරයා එම දත්ත විශ්ලේෂණය කරමින් ඒ මත පදනම්ව ගැටලුවලට විසඳුම් ලබා දිය යුතු බවද පවසන ලදි. | | කළාප අධ්‍යාපන අධ්‍යක්ෂ, තංගල්ල/ වලස්මුල්ල/ හම්බන්තොට |
| 1.2 | දිස්ත්‍රික්කයේ අත්‍යාවශ්‍ය තනතුරුවල හිඟය | දිස්ත්‍රික්කයේ බොහෝ ආයතනවල අත්‍යාවශ්‍ය රාජකාරීවල නිරතවන නිලධාරීන්ගේ හිඟයක් පවතින බවට ආයතන මඟින් ලිඛිතව අතිගරු ජනාධිපතිතුමා වෙත ඉල්ලීම් ඉදිරිපත් වී තිබූ අතර, විශේෂයෙන්ම තාක්ෂණ නිලධාරීන්ගේ හිඟයක් පවතින බවට තොරතුරු ඉදිරිපත් විය. තව ද විශ්‍රාමලත් නිලධාරීන් යළි බඳවා ගැනීමට අවස්ථාව නොමැති බවට ද කරුණු ඉදිරිපත් විය.<br><br>නවමුත් වූ රාජ්‍ය සේවය යළි ශක්තිමත් කිරීමට රජය සැලැසුම් කර ඇති බවත් ඒ සඳහා, රාජ්‍ය සේවයේ වැටුප් ආකර්ෂණීය තලයක පිහිටුවීම සිදුකර ඇති බවත් එළඹෙන අයවැයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළු සමාන ක්ෂේත්‍රවල රාජකාරී ඉටුකරන නිලධාරීන් වෙනුවෙන් අවශ්‍ය වාහන ලබා දීම සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට අපේක්ෂා කරන බවත්, තිස්දහසකට වැඩි ප්‍රමාණයක් රාජ්‍ය සේවයට අත්‍යාවශ්‍ය පුරප්පාඩු සඳහා නව සැලසුමකට අනුව බඳවා ගැනීම් සිදුකිරීමට සැලසුම් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදි.<br><br>මීට අමතරව කාර්යක්ෂම රාජ්‍ය සේවයක් උදෙසා තාක්ෂණික ක්‍රම භාවිතා කරනු ලබන ඩිජිටල්කරණ සංස්කෘතියක් ඇතිකරලීම සඳහා නිලධාරීන් සහ පුරවැසියන් තුළ නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතයන් පිළිබඳ ප්‍රවණතාවයක් ඇති කළ යුතු බවටත්, ඒ අනුව, සැප්තැම්බර් මස ඩිජිටල්කරණ මාසය ලෙස නම්කර ඊට අදාල භාවිත ක්‍රමවේද දියත් කිරීම හා ඩිජිටල් ජාතික හැඳුනුම්පත | රජයේ ප්‍රතිපත්තිය අනුව මහජනතාවට වඩාත් සමීප සේවාවක් සැපයීම සඳහා නිලධාරීන් කටයුතු කල යුතු බව අවධාරණය කරන ලදි. | දිස්ත්‍රික්කයේ සියලුම ආයතන ප්‍රධානීන් |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණු | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | හඳුන්වා දෙමින් නව ආරම්භයක් ඒ සඳහා ලබා ගැනීම අපේක්ෂාව බවත්,මෙලෙස මුල් වසර පහ තුළ රට ඩිජිටල්කරණයට ලක් කිරීම ප්‍රධාන සැලැස්ම බවත් පැහැදිලි කරන ලදි. | | |
| | | | | |
| 02 | දකුණු පළාත් සංවර්ධන වැඩසටහන් | | | |
| 2.1 | දකුණු පළාත් සංවර්ධනය | දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය මගින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා වෙන් කළ රු.මි. 574 ක් අතුරින් මේ වන විට වියදම් දරා ඇත්තේ රු.මි. 23.32 කි. එය වෙන් කළ මුදලින් 4% ක අගයක් නිසා වර්ෂය තුළ ව්‍යාපෘති අවසන් කිරීම අභියෝගයක් විය හැකි බව සාකච්ඡා විය. එහෙත් අනුමත ව්‍යාපෘති 211 න් මේ වන විට 107 ක වැඩ ආරම්භ කර ඇති බවත්, සැලසුම් කළ පරිදි සියළුම ව්‍යාපෘති අවසන් කළ හැකි බවටත් කරුණු ඉදිරිපත් විය. තව ද පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රු.මි.450.44ක් මගින් ව්‍යාපෘති 84ක් ද, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ රු.මි.383.44ක් මගින් ව්‍යාපෘති 125ක් ද, ධීවර අමාත්‍යාංශය යටතේ රු.මි.288.37ක් මගින් ව්‍යාපෘති 90ක් ද, ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ රු.මි.110.17ක් මගින් ව්‍යාපෘති 65ක් ද, ලෙස මෙම දිස්ත්‍රික්කයට රු.මි.1805.67ක් වැයකර ව්‍යාපෘති 575ක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බවත්, ඉන් දැනටමත් ව්‍යාපෘති 424ක් අවසන් කර ඇති බවත් මෙම වර්ෂය තුළ සියලු කටයුතු නිමකල හැකි බවටත් කරුණු ඉදිරිපත් විය. | මෙම වසර අවසන් වීමට පෙර අදාළ ප්‍රතිපාදන ජනතා අවශ්‍යතා වෙනුවෙන් නිසි පරිදි වැය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළ අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස උපදෙස් දෙන ලදි. | ප්‍රධානලේකම්, දකුණු පළාත<br><br>අමාත්‍යාංශ ලේකම්වරුන්, දකුණු පළාත් සභාව<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්), දකුණු පළාත<br><br>පළාත් සභාව යටතේ වන දිස්ත්‍රික්කයේ සියලුම ආයතන ප්‍රධානීන් |
| 03 | මධ්‍ය රජය යටතේ ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් | | | |
| 3.1 | වකුගඩු රෝග ප්‍රතිකර්ම ඒකකයේ ඉදිකිරීම් නතරවී තිබීම | 2017 වර්ෂයේ මහල් 4කින් යුත් වකුගඩු රෝග ප්‍රතිකර්ම ඒකකයෙහි ඉදිකිරීම් ආරම්භ කලත් පසුව ඇතිවූ කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුධය හේතුවෙන් අදාල ඉදිකිරීම් නතරවී ඇති බවත් මේ වන විට මහල් 3 ක පමණක් කොන්ක්‍රීට් රාමුව සහ බිත්ති බැඳ නතරකර ඇති හෙයින් සිදුවන මූල්‍යමය හානිය පිළිබඳව හා වසරකට වකුගඩු රෝගීන් 2000 කට වැඩි ප්‍රමාණයක් වකුගඩු සායනයට පැමිණෙන බවත් රුධිර කාන්දුකරණ ඒකකයේ දැඩි අවශ්‍යතාවය පිළිබඳව සහ මෙන්ම මෙම වාට්ටුව ඉදිකිරීම් අවසන් කිරීමට හා උපකරණ මිලදී ගැනීමට ආසන්න වශයෙන් රු.මි. 70 ක් පලමු අදියර වශයෙන් වෙන්කර | මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර එම ප්‍රතිපාදන (රු.මි.70ක්) වෙන් කර දීමට කටයුතු කරන බවත් මෙම ව්‍යාපෘතිය මෙම වසර තුළ අවසන් කල යුතු බවට උපදෙස් දෙන ලදි. | අධ්‍යක්ෂ , දිස්ත්‍රික් මහරෝහල, හම්බන්තොට |

. බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | ගැනීම අවශ්‍ය බවටත් කරුණු සාකච්ඡා විය. | | |
| 3.2 | විමධ්‍යගත අයවැය වැඩසටහන ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන | විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ දිස්ත්‍රික්කය සඳහා රු.මි. 80 ක් වෙන් වී ඇති අතර, ඒ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12 සඳහා අනුමත වී ඇති ව්‍යාපෘති 49 න් 41ක් සඳහා ඇස්තමේන්තු සකස් කර අවසන් බවත්, ව්‍යාපෘති 8ක් සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතින බවත් ප්‍රකාශ කරන ලදි.<br><br>එමෙන්ම, ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහනට අදාළව ව්‍යාපෘති 28ක් අනුමත වී ඇති අතර, ඉන් ව්‍යාපෘති 25ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 79.2 ක් අනුමත වී ඇති බවත්, ඉන් ව්‍යාපෘති 12ක් සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති බවත්, ඉතිරි ව්‍යාපෘති 03, මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීමට රු.මි. 110.00 ක් අනුමත වී ඇති බවත්, ඉන් ව්‍යාපෘති 02ක වැඩ ආරම්භ කර ඇති බවත්, මෙම වර්ෂය තුළ මෙකී සියළු ව්‍යාපෘති නිම කළ හැකි බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදි. | වක්‍රලේඛ උපදෙස් පරිදි නියමිත දිනට ව්‍යාපෘති අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), හම්බන්තොට<br><br>ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය.<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 3.3 | නිලසෙවන/ සේවා පියස් අලුත්වැඩියා කිරීම. | 2023 වර්ෂයේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට යොමු කර ඇති ඉල්ලීම් අනුව නිල සෙවන/ සේවා පියස කාර්යාල අලුත්වැඩියා කටයුතු සඳහා රු.මි.157ක් මෙම වර්ෂය තුළ ලැබී ඇති බවත්, දැනටමත් ව්‍යාපෘති යෝජනා 97ක් වෙනුවෙන් රු.මි.73ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ලබා දී ඇති බවත් සඳහන් කරන ලදි. තවදුරටත් කළ යුතු අලුත්වැඩියාවන් සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් රු.මි.07කට අදාළ යෝජනා 11ක් ලැබී ඇති බවත්, ඒ සඳහා ද ප්‍රතිපාදන නිකුත් කිරීමට කටයුතු කරන බවත් දැන්විය. ප්‍රතිපාදන ලබා දීමේදී 2025 වර්ෂය තුළ හඳුනාගනු ලබන නව යෝජනා සඳහා ද ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉල්ලීම් ලැබෙන අතර, මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇති බවත්, ඒ සඳහා මේ වන තෙක් උපදෙස් ලැබී නොමැති බවත් දැනුම් දෙන ලදි. නව ද අනුමැතියක් ලැබේ | නිල සෙවන කාර්යාල තිබෙන ග්‍රාම නිලධාරී වසම්වල සහ එම කාර්යාල නොමැති ග්‍රාම නිලධාරී වසම්වල මහජන සේවා සැපයීමේ කාර්යක්ෂමතාවද සැලකිල්ලට ගෙන නිවැරදි අධ්‍යනයක් කර අවශ්‍යතා හඳුනා ගන්නා ලෙස උපදෙස් දෙන ලදි. | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට<br><br>අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන), හම්බන්තොට<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | නම් දැනට දිස්ත්‍රික්කයට ලැබී ඇති ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් අලුතින් නිලසෙවන කාර්යාල ඉදිකිරීමද කළ හැකි බව දැනුම් දෙන ලදී. | | |
| 04. | අනෙකුත් ආයතන මගින් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය | | | |
| 4.1 | ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම | එක් එක් ආයතනවලින් ඉදිරිපත් කරන ලද තොරතුරු දෙනු ලැබූ උපදෙස් ඇමුණුම් අංක 01 යටතේ ඉදිරිපත් කර ඇත. | | |
| 05. | අනතුරුව **2025.07.11** දිනට අදාල න්‍යාය පත්‍රයේ කරුණු සාකච්ඡා කරන ලදී. ඒවා පහත පරිදි වේ. | | | |
| 5.1 | ගරු ජනාධිපතිතුමන්ගේ අවධානය සඳහා යොමුවන සුවිශේෂී ගැටළු, | | | |
| | I. සංවර්ධන කටයුතු සඳහා ඉඩම් වෙන්කර ගැනීම සම්බන්ධ ගැටළු | | | |
| 5.1.1 | මහවැලි අධිකාරියට අයත් ඉඩම් නිරවුල් කරගැනීම. | මහවැලි අධිකාරිය යටතේ පවතින අක්.81000 ක ඉඩම් වපසරිය ඇතුළත ගොවීන් සඳහා ලබා දී ඇති ඉඩම් හැර ව්‍යාපෘති සඳහා හෙක්ටයාර් 2716 ක් ලබා දී ඇති බවත් එකී ඉඩම් කොටස් ඇතුලත අනුමැතින් ලත් සෝලා ව්‍යාපෘති 57 ක් අතුරින්<br>දීර්ඝකාලීන බදුපදනම මත ව්‍යාපෘති 07ක් ද,<br>දීර්ඝකාලීන බදුපදනම මත අනුමැතිය ලබා දී ඇති නමුත් මේ වන තෙක් වැඩ ආරම්භ කර නොමැති ව්‍යාපෘති 17 ක් ද,<br>වැඩ ආරම්භ කර ඇති ව්‍යාපෘති 05ක් ද,<br>ව්‍යාපෘති 1 ක් සඳහා පෙර දිනයේ අනුමැතිය ලබා දුන් බවත්,<br>ඒ අනුව ව්‍යාපෘති 30ක් සඳහා අනුමැතිය ලැබී ඇති බවත්, මේ වන විට ව්‍යාපෘති 04ක් නිෂ්පාදන කාර්යය ආරම්භ කර ඇති බවටත් කරුණු ඉදිරිපත් විය.<br>එමෙන්ම පරිසර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාවලිය තුළ තවත් ව්‍යාපෘති 07ක් පවතින බවත්,<br>ඉතිරි ව්‍යාපෘති 15 ක් සඳහා මූලික එකඟතාවය ලබාදී ඇති බවත් මෙකී ව්‍යාපෘති සඳහා හෙක්ටයාර් 180 ක් වෙන්කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් මෙම ව්‍යාපෘති 15 පිළිබඳ ප්‍රගතියක් මෙතෙක් ඉදිරිපත් කර නොමැති බවත්, 2025.07.31 දින වන විට අවශ්‍ය මූලික කටයුතු සිදුනොකරන ලද ව්‍යාපෘති සඳහා වෙන් කරන ලද ඉඩම් නැවත පවරා ගැනීමට කටයුතු කරන බවත් වැඩිදුරටත් පැහැදිලි කරන ලදී. | ව්‍යාපෘති සඳහා ඉඩම් ලබා දීමේදී ඉඩම් ලබා දුන් සත්‍ය ඉඩම් හිමියා හා ව්‍යාපෘති අවසරපත්‍රය සතු පුද්ගලයා විසින්ම ව්‍යාපෘතිය බිම් මට්ටමින් ක්‍රියාත්මක කරන්නේද යන්න සොයා බැලිය යුතු බවත් මෙසේ ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් ව්‍යාපෘති එකින් එක පිළිබඳව සකස්කරන ලද පැහැදිලි වාර්තාවක් ලබා දෙන ලෙසත් උපදෙස් දෙන ලදී.<br><br>තවද, ලබා දීඇති ව්‍යාපෘතිය අදාල කාලය තුළ ආරම්භ නොකලහොත් එකී ඉඩම් කොටස් නැවත මහවැලිය වෙත ලබා ගතයුතු බව දැනුම් දෙන ලදී.<br><br>එසේම, විවිධ බලඅධිකාරින්ට සහ අයථා ගනුදෙනු සඳහා ඉඩම් ලබා දෙනවා වෙනුවට, වඩාත් සුදුසු අයට සහ ආර්ථික වශයෙන් ප්‍රතිඵලදායක කටයුතු සඳහා ඉඩම් ලබා දීමේ සංස්කෘතියක් රටට අවශ්‍ය බව පැහැදිලි කරන ලදී. | නේවාසික ව්‍යාපාර කළමනාකරු<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය |





ඩිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | අලි කොරිඩෝවන්ට අදාල භූමියෙන් ව්‍යාපෘති කටයුතු සඳහා බිම් කොටස් ලබාදී ඇති බවත් එය අලි මිනිස් ගැටුමට හේතුවන බවත් සාකච්ඡා විය. | වනඅලි කළමනාකරණ රක්ෂිතයේ වනඅලි ගැටලුවට විසඳුම් ලෙස යෝජනා කෙරෙන අලි කොරිඩෝව ඉදිකිරීම සඳහා හඳුනාගෙන ඇති ඉඩම් පෞද්ගලික අංශයේ හෝ රාජ්‍ය අංශයේ කුමන පාර්ශ්වයකට අයත් වුවද එම ඉඩම් පවරා ගනිමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකළයුතු බව අවධාරණය කළේය. | |
| 5.1.2. | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් නිරවුල් කර ගැනීම. | මේ වන විට අක්කර 4183 ක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වන අතර අක්කර 2500 කට ආසන්න ප්‍රමාණයක් අයිතිය නිරවුල් කිරීම සම්බන්ධව නඩු කටයුතු 21 පවතින බව හා මැනුම් කටයුතු සිදුකර ඉඩම් පෙන්වූ ප්‍රමාණය 700 කට ආසන්න බවත් ඉතිරි ඉඩම් ප්‍රමාණය රජයේ ආයතන සඳහා ලබා දී ඇති බව පැහැදිලි කරන ලදි.<br><br>එහෙත් නව රජය පත්වී මෙතෙක් පැවැත්වූ සම්බන්ධීකරණ කමිටු රැස්වීම් අවස්ථාවලදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කළද මේ වන තෙක් එය නොලැබුන බවටද කරුණු ඉදිරිපත් විය. | මෙකී ඉඩම් වඩාත් ආර්ථික වශයෙන් ප්‍රතිලාභ පවතින ව්‍යාපෘති සඳහා වඩාත් සුදුසු පුද්ගලයන් වෙත පමණක් බැහැර කළ යුතු බවත් අවධාරණය කරමින් මෙකී කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පැහැදිලිව හඳුනාගෙන මේ වනවිට පවතින තත්ත්වය පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදි. | අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය) |
| 4.1.3 | ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් නිරවුල් කර ගැනීම. | හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ආයෝජන මණ්ඩලයට අයත් කළාප 3 ක් පවතින බවත් ඉන් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය තුළ ආයෝජන කර්මාන්ත 7 ක් පවතින බවත් ඉදිරි ආයෝජනයන් සඳහා හෙක්ටයාර් 175 ක භූමි ප්‍රමාණයක් ඉතිරිව පවතින බවත් පැහැදිලි කරන ලදි.<br><br>එසේම, අක්කර 5100 ක ප්‍රාණයක් අත්පත්කරගැනීමට අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇති බව හා ඒ අනුව, ආරම්භක නැමති ඉඩම පවරා ගැනීම් සිදුකර ඇති බව ද එහි අක්කර 951 ක් පමණ පවතින බවත් ඉන් අක්කර 200 ක ප්‍රමාණයක් ඖෂධ වගාවකටද අක්කර 500 ක ප්‍රමාණයක් තෙල්පිරිපහදුව සඳහා ද අක්කර 30 ක ප්‍රමාණයක් යකඩ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීම සඳහා ද සූදානම් බවත් මෙකී ආයෝජන අවස්තා සඳහා විදුලි හා ජල පහසුකම් ලබා දීම සඳහා පිළිවෙලින් අක්කර 7 හා ½ ක් | ඉඩම් නිදහස් කර ගැනීම සඳහා යම් දිමනාවක් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදි. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය |



විමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | වෙන්කර ඇති බව පැහැදිලි කරන ලදී.<br><br>මෙසේ අත්පත් කරගන්නා ලද්දේ මහවැලි වලව වම්ඉවුර යටතේ දියුණු කරන ලද ඉඩම් බව හා අත්පත්කරගන්නා ලද රජේ ඉඩම් නොවන වෙනත් ඉඩම් සඳහා විකල්ප ඉඩම් ලබාදී අනාවසර වගාකරුවන් සඳහා අක්කර 2 කට යටත්ව ලක්ෂ 2 කට ආසන්න සානුකම්පිත දීමනාවක් 45 දෙනෙක් සඳහා ලබාදී ඇති බව ඔවුන් තවමත් මෙකී ඉඩම් භුක්ති විඳින අතර ඉවත් කිරීමෙ ගැටවුවක් පවතින බව දන්වන ලදී. | ආයෝජන කළාපය සඳහා ඉඩම් නිදහස් කරගැනීම අවශ්‍යනම් විධිමත් සමීක්ෂණයක් සිදුකර මේ වන විට මෙකී ඉඩම් හේතුවෙන් ජීවනෝපාය අහිමි වන්නේනම් එකී ගොවීන් සඳහා නැවත ඒ අය සඳහා සාධාරණ දීමනාවක් ආයෝජන මණ්ඩලය මඟින් ලබා දිය යුතු බව තීරණය කරන ලදී. | |
| 4.1.4 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අයත් ඉඩම් නිරවුල් කර ගැනීම. | දැනට සකස් කර ඇති දීමනා පත්‍ර සංඛ්‍යාව 58,638 ක් හා සකස් කිරීමට ඇති බලපත්‍ර සංඛ්‍යාව 33,112 ක් දරජයේ ඉඩම් අනාවසරයෙන් භුක්ති විඳින ලබා දීමට සුදුසු ඉඩම් කැබලි ප්‍රමාණය අක්කර 4,907 ක් රූඩ 2 ක් හා පර්චස් 8 ක් පුද්ගලයින් 9,870 ක් සඳහා ලබා දීමට පවතින බවත් මැනුම් කිරීමට ඇති ඉඩම් කැබලි ප්‍රමාණය 38,716 ක් හා යම් ආයෝජනයක් හා සුදුසු කටයුතු සඳහා යොදාගත හැකි රජයේ නිදහස්ව තිබෙන ඉඩම් ප්‍රමාණය අක්කර 1,106 ක් පර්චස් 36 බව පැහැදිලි කරන ලදී. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව ලබාදීමට සුදුසු ඉඩම් කැබලි ලබා දීමට නිසි ක්‍රමවේදයක් සකසා එකී ලබා දෙන ලදඉඩම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත්කර එම ඉඩම් සුදුසු අය වෙත ලබා දෙන ලෙසත් මේ වන විට ඉතිරි රජයේ ඉඩම් බැහැරකිරීම් නවත්වන ලෙසත් දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් - හම්බන්තොට.<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 4.1.5 | වන අලි කලමනාකරණ රක්ෂිතය නිශ්චිතව වෙන් කර ගැනීම හා රෙගුලාසි ගැසට් කර ගැනීම. | මත්තල ගුවන්තොටුපල මූලික කරගනිමින් මෙම වන අලි කලමනාකරණ රක්ෂිතය 2010 වසරේ අක්කර 30,000 ක් ලෙස යෝජනා වූවත් පසුව 2021 අප්‍රේල් 9 වන දින හෙක්ටයාර් 23,746 ක් වෙන් කර ප්‍රකාශයට පත්කරන ලද අතර ඒ වන විට මෙකී භූමිය තුළ අනාවසර භුක්ති විඳීම් හා ආයතන සඳහා වෙන් කිරීම් කර එකී කොටසක් සංවර්ධන කටයුතු සිදුකර ඇති අතර අනෙක් ලඳු කැලෑ ප්‍රදේශ තුළ ඉතා හොඳ සත්ත්ව වාසස්ථාන පවතින අතර මේ හේතුවෙන් අලි මිනිස් ගැටුම දිගින් දිගටම පවතින බව පැහැදිලි කරන ලදී.<br><br>එසේම, මෙම වන අලි කලමනාකරණ රක්ෂිතයට අදාලව අදාල ආයතන එක්ව නීති රෙගුලාසි | මෙකී භූමිය නිශ්චිතව හඳුනාගෙන ඊට අදාල හා මේ සඳහා සුදුසුම කණ්ඩායම හඳුනාගෙන එකී ආයතන සක්‍රීය දායකත්වයෙන් එක්ව හම්බන්තොට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලැස්මක් මාස 2 ක් ඇතුළත සකස් කරන ලෙස උපදෙස් දෙන ලදී. එකී සැලසුමට අදාල ආයතන සතු සියළු දත්ත එක්කරගැනීම, විධිමත් අධ්‍යයනයක් සිදුකිරිම, මීට අදාල සාමාන්‍ය ජනතාව දැනුවත් කිරිම, ... ආදී වශයෙන් ඇතුලත්කර එකී සැලැස්මට අනුව හැහෙන දේ වෙන යොමු නොවී දිස්ත්‍රික්කයට වඩා සුදුසු, මධ්‍යගත, විධිමත් හා ගුණාත්මක ඉඩම් පරිහරණ සැලැස්මක් සකස් කර ස්ථිර විසඳුමකට එන ලෙස උපදෙස් දෙන ලදී.<br><br>එකී රෙගුලාසි සඳහා අනුමැතිය පිළිබඳව සොයාබැලීමක් කරන බව දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම්, හම්බන්තොට<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>අදාළ සියළු ආයතන ප්‍රධානීන්<br><br>සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් අංශය) |



නිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | සකස්කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් අනතුරුව 2022 වර්ෂයේ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බවත් එකී රෙගුලාසි සඳහා අනුමැතිය මෙතෙක් නොලැබී ඇති බව දැනුම් දෙන ලදි. | | |
| 4.1.6 | කිරින්ද වරායේ ගොඩගැසී ඇති වැලි වැටිය සහ අනවසර ඉදිකිරීම් ඉවත් කර ගැනීම. | ගොඩගැසී ඇති වැලි මීටර් කියුබ් 154000 පමණ කොටසින් වැලි මීටර් කියුබ් 71000 ක් මුහුදට දැමිය යුතු බවත් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් දැනුම් දුන්නද මේ සඳහා මිලියන 26 ක පමණ මුදලක් අවශ්‍ය වන අතර එකී මුදල් ඔවුන් සතුව නොමැති බව දැනුම් දී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. තව ද ඉතිරි වැලි ප්‍රමාණය විකිණීම මඟින් අරමුදල් සොයාගැනීමේ හැකියාවක් පවතින බවට කරුණු ඉදිරිපත් කරන ලදි. එහෙත් ධීවර වරාය ව්‍යාපාර කටයුතු නොකළ යුතු බවත්, ලබා දෙන රු මි.26න් වැලි ඉවත් කිරීම සුදුසු බවත් සාකච්ඡා විය. | මුහුදට දැමිය යුතු වැලි ප්‍රමාණයට අදාළව රු.මි.26 ලබාදෙන බවත්, මූලික කටයුතු සූදානම් කර ගන්නා ලෙසත්, විකිණිය යුතු වැලි සම්බන්ධව ප්‍රසම්පාදන කටයුතු අනුව සිදු කළ යුතු බවත් තීරණය කරන ලදි. | සාමාන්‍යාධිකාරී, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව.<br><br>කැණීම් ඉංජිනේරු - භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය<br><br>සහකාර අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, හම්බන්තොට.<br><br>සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>කළමනාකරු ධීවර වරාය, කිරින්ද |
| 4.1.7 | දිස්ත්‍රික්කයේ අනෙකුත් ධීවර වරායන් වල පවතින ගැටළු. | දිස්ත්‍රික්කයේ ධීවර වරායන් 5 ක් පවතින බවත් මේ අශ්‍රිතව ගොඩගැසෙන ෆයිබර් ග්ලාස් ඇතුළු ඝණ අපද්‍රව්‍ය හේතුවෙන් විශාල වශයෙන් පරිසර හානි සිදුවන බවත් සෙන්ටිග්‍රේඩ් අංශක 2000 ක ප්‍රධාන ධාහකයක් සවිකිරීමෙන් මෙයට විසඳුමක් සෙවිය හැකි බවට කරුණු ඉදිරිපත් වුවද එයින් පාරාසරික හානිය අවම කල නොහැකි බවට ද කරුණු ඉදිරිපත් විය. තවද, මේ සඳහා සනීපාරක්ෂක කසල රැඳවුමක් සුදුසු බවත් හම්බන්තොට මහනගර සභා බල ප්‍රදේශය තුළ සුදුසු ඉඩමක් හා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේ නම් මෙම ගැටලුව අවම කිරීමට සනීපාරක්ෂක කසල රැඳවුමක් සකස් කිරීමේ තාක්ෂණික හැකියාව පවතින බවටත් කරුණු ඉදිරිපත් විය.<br><br>තවද, හම්බන්තොට වරායේ වරාය පපිවිසුම් මාර්ගය මාස 8ක් හෝ 9ක් ගතවන විට වැලිවලින් පිරෙන බවත් පිවිසුම් මාර්ගය පළලෙන් අඩු හා වරායන් ඉදිකිරීමේදී ඇතිවී තිබෙන තාක්ෂණික ගැටලු මීට බලපාන | මෙකී ගැටලුවට විසඳුම් ලෙස අදහස් කීපයක් මතුවුවද ඒවා විද්‍යාත්මකව හා අනෙකුත් කරුණු අනුව සාර්ථකම විසඳුමද යන්න සොයා බැලිය යුතු බවත් ඒ සඳහා අදාල ආයතන හා නාගරික සංවර්ධන අධිකාරියේ ද මැදිහත්වීමෙන් සුදුසුම දේ කුමක්ද යන්න හඳුනාගෙන දන්වන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>මේ පිළිබඳව අධ්‍යයනය කර සුදුසු විසඳුම් සහිතව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පැහැදිලි කරන ලදි. | සාමාන්‍යාධිකාරී, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව.<br><br>සහකාර අධ්‍යක්ෂ, මධ්‍යම පරිසර අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, හම්බන්තොට.<br><br>සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>කළමනාකරු, සියලුම ධීවර වරායන්වල<br>සහකාර අධ්‍යක්ෂ, හම්බන්තොට ධීවර වරාය |

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට



CamScanner

| අ.අ. | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | බවත් මේ හේතුවෙන් අනතුරු සිදුවීම වැඩිවෙමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | | |
| 4.1.8 | දැනට වැඩ ආරම්භකර අතරමග නතර වී ඇති පාලම් ඉදිකර ගැනීම. | පළාත් සභා හා ග්‍රාමීය මාර්ග යටතේ පවතින මෙකී පාලම් 18 ක් හඳුනාගෙන ඉන් 5 ක වැඩ නිමකර ඇති බවත් ඉතිරි පාලම් වලින් ප්‍රමුඛතාවය ලබා දියයුතු පාලම් 5 ක් හඳුනාගෙන ඇති බවත් ඒ සඳහා මෙම වසර තුළ වැඩකොටස් නිම කිරීමට මිලියන 200ක් පමණ අවශ්‍ය බවත් සියලු පාලම් සඳහා වැඩ නිම කිරීමට බිලියන 1 ක් පමණ වැය විය හැකි බවට කරුණු පැහැදිලි කරන ලදී. | මෙම පාලම් වල වැඩ කොටස් නිම කිරීමට සුදුසු හා හැකියාව පවතින තත්ත්වය සොයා බලා දැන්වීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී. | ප්‍රධාන ඉංජිනේරු, මාර්ග සංවර්ධන අධිකාරිය |

දිස්ත්‍රික්කයේ සංවර්ධන කටයුතුවලදී මතුව ඇති ගැටලු සහ අභියෝග පිළිබඳව මෙහිදී පුළුල් ලෙස විමසා බැලුණු අතර, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සඳහා අදාල සියළුම නිලධාරීන්ගේ පැමිණීම පිළිබඳ අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සඳහා දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් ද පැමිණ සිටි සියලුදෙනාටම ස්තූතිය පලකිරීමෙන් අනතුරුව පස්වරු 12.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල්ඉන්ද්‍රජිත්ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2025 ජුලි මස ...22...................
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.



CamScanner

හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනෙකුත් ආයතනවල සංවර්ධන ව්‍යාපෘතිවල 2025.06.30 දිනට ප්‍රගතිය

| අ.අ | ආයතනය | ව්‍යාපෘති සංඛ්‍යාව | 2025 වර්ෂයට වෙන්කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 4 | 1,135.37 | 148.19 |
| 2 | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය | 1 | 12.87 | 3.19 |
| 3 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 39 | 106.71 | |
| 4 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 103 | 276.78 | 11.31 |
| 5 | අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 8 | 39.76 | 2.01 |
| 6 | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා) | 6 | 3.80 | 2.88 |
| 7 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 1 | 19.00 | 7.80 |
| 8 | නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය | 8 | 222.78 | 47.74 |
| 9 | ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව | 14 | 56.28 | 11.00 |
| 10 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 14 | 286.49 | - |
| 11 | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 72 | 261.91 | |
| 12 | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (දකුණු කලාපය) | 11 | 19.17 | 3.32 |
| 13 | කලාප අධ්‍යාපන කාර්යාලය - තංගල්ල | 46 | 20.17 | 15.22 |
| 14 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (අන්තර්පළාත්) | 7 | 11.16 | 1.89 |
| 15 | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය (පළාත්) | 28 | 201.46 | 17.57 |
| | **එකතුව** | **362** | **2,673.69** | **272.11** |

බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

CamScanner